කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2016

සිංහල භාෂාව හා සාහිත්‍යය

8 ශ්‍රේණිය

කාලය පැය 03 යි

නම / අංකය

## I පත්‍රය

- ප්‍රශ්න සියල්ලට ම උත්තර ලියන්න.
- මෙම ප්‍රතයට හිමි ලකුණු සංඛ්‍යාව 40 කි.

- 1, 2 ප්‍රශ්නවල ඉරි ඇඳි කොටසේ අර්ථයට **වඩාත් සමීප** අර්ථය දෙන ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.

1. කෙනෙකුගේ දියුණුවට **අකුල් හෙළීම** නරක පුරුද්දකි.
   1. ඊර්ෂ්‍යා කිරීම. 2. වෛර කිරීම 3. බාධා කිරීම 4. අමනාප වීම
2. අවුරුදු සමයේ අපේ අම්මාට **ඉස්පාසුවක්** නොවීය.
   1. විවේකයක් 2. කලබලයක් 3. අපහසුවක් 4. පහසුවක්

- 3, 4 ප්‍රශ්නවල යෙදී ඇති පද අතුරින් අක්ෂර වින්‍යාසය **නිවැරදි** ව **යෙදී ඇති** පදය තෝරන්න.

3. 1. විශිෂ්ඨ 2. සූර්යයා 3. විස්සාස 4. සමස්ථ

4. 1. නිෂ්ශබ්ද 2. ආස්වාදය 3. ශුශ්ක 4. ප්‍රසංශාව

5. මහප්‍රාණ අකුරක් හා මූර්ධජ අකුරක් යෙදී ඇති පදය තෝරන්න.
1. භික්‍ෂු 2. විප්‍රලම්භ 3. ධේනුව 4. ප්‍රාගුණ්‍ය

6. කොම්බුව, ගයනුකිත්ත, රකාරාංශය යෙදුණු පදය තෝරන්න.
   1. සෞභාග්‍ය 2. පෞද්ගලික 3. ගෞතම 4. ප්‍රෞඪ

- 7, 8 ප්‍රශ්නවල මුලින් සඳහන් පදයට සමාන නොවන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

7. මොළොක් - 1. සිනිඳු 2. මෘදු 3. සුමුදු 4. දලු
8. මහත් - 1. ඉමහත් 2. මහා 3. උදාර 4. විශාල

- 9, 10 ප්‍රශ්නවල දී ඇති පදයට විරුද්ධාර්ථය දෙන පදය තෝරන්න.

9. දුගතිය - 1. අගතිය 2. සුගතිය 3. ආනතිය 4. අවනතිය
10. සදාචාර - 1. ආචාර 2. විෂමාචාර 3. දුරාචාර 4. විචාර

11. පහත වාක්‍යයේ ඉරි ඇඳි පදවල පිල්ලම් නිවැරදි ව යෙදී ඇති පිළිතුර තෝරන්න.

▲ රැලි දමා මැසූ ගවුම රුවට පෙනිණි.
   1. ඇදපිල්ල, ඇදපිල්ල 2. පාපිල්ල, ඇපිල්ල
   3. ඇදපිල්ල, පාපිල්ල 4. කෙටි ඇදය, දීර්ඝ ඇදය

12. විරුද්ධ පද දෙකක් එක්වී සෑදෙන යුගල පදය තෝරන්න.

1. අය වැය 2. මුදල් හදල් 3. හරකා බාන 4. බඩු මුට්ටු

13. පහත වාක්‍යයෙහි ඉරි ඇඳි පද අයත් වන ක්‍රියාවර්ගය වන්නේ

▲ අම්මා පැන්සල ගෙන මට අකුරු ලියවයි.

1. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
2. පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
3. මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
4. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා

● 14,15 ප්‍රශ්නවලට ගැළපෙන තනි පද තෝරන්න.

14. ඇඳුම් මසන්නා - 1. කරණවෑමියා 2. සපතේරුවා 3. සන්නාලියා 4. පෙදරේරුවා

15. තදබල අසනීපයකින් සුව කළ නොහැකි තත්ත්වයක පසුවීම. -

1. දුස්සාධ්‍ය 2. අභාග්‍ය 3. මරණීය 4. අසාධ්‍ය

● දී ඇති අර්ථයට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න. ( 16, 17 ප්‍රශ්න )

16. පිට අයගේ උපකාරයෙන් කටයුතු කිරීම.

1. ආඬි හත් දෙනාගේ කැඳ හැළිය වාගෙයි.
2. හොරාගේ අම්මාගෙන් පේන අහනව වගෙයි.
3. ඉබ්බන්ගෙන් පිහාටු ගන්නව වාගෙයි.
4. අනුන්ගෙ පානෙන් එළිය බලනව වගෙයි.

17. කරදරයකින් තවත් කරදරයකට වැටීම.

1. කඩි රැල මැදට උණු අළු දැම්මා වගෙයි.
2. කබලෙන් ළිපට වැටුණා වගෙයි.
3. කළුවා මාරපන් ගියා වගෙයි.
4. කඩුව ගිල්ල වගෙයි.

18. පහත සඳහන් වාක්‍යයේ හිස්තැන් වලට සුදුසු පද නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

● .................. ගැබ පුරා විහිදුණු.................. එළිය නිසා මගේ.................. පුරා සතුට නැගුණි.

1. නුබ, හඳ, හද
2. නුඹ, හඳ, හද
3. නුබ, හද, හඳ
4. නුඹ, හද, හඳ

● 19, 20 ප්‍රශ්නවල ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා දී ඇති අර්ථ වැරදි ලෙස යෙදුණු පිළිතුර තෝරන්න.

19.
1. හණ පෝරුව - මැණික් කපා ඔප දැමීමට භාවිත කරන යන්ත්‍රය
2. ගොම්පස් - ගොම
3. ඇඹුල - කුඹුරේ දී දෙන ආහාරය
4. දෙහීය - හී දෙකක්

20.
1. තෙප්පම - කුඩා ඔරුව
2. අම්බරුවෝ - මී හරක්
3. කැකුළා - පොඩි එකා
4. මඩක්කුව - මැටි කෝප්පය

( ලකුණු 02 X 20 - 40 )

## II පත්‍රය

- 1, 2,3 ප්‍රශ්න අනිවාර්ය වේ. 4 - 7 දක්වා ප්‍රශ්න අතරින් දෙකකට පමණක් උත්තර ලියන්න.

1. ඔබ විසින් පන්ති කාමරයේ දී කරන ලද " රස වින්දන කවය" ඇගයීම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

    i. රස වින්දන කවය සඳහා ඔබට ලැබුණු කවි පන්තිය කුමක් ද ? (ලකුණු 02)

    ii. ගුරුවරයා ඔබට දුන් උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)

    iii. ඇගයීම සඳහා ඔබ ලැබුණු කවි පන්තියෙන් එක් කවියක් ලියන්න.(ලකුණු 04)

    iv. රස වින්දන ඇගයීම සඳහා ඔබට ලැබුණු ප්‍රශ්න දෙකක් ලියන්න. (ලකුණු 04)

    v. ඇගයීම මඟින් ඔබ ලබා ගත් ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

2. පහත සඳහන් මාතෘකා වලින් එකක් තෝරා ගෙන වචන 150 කට නොඅඩු රචනයක් ලියන්න.

1. කියවමු - දිනමු
2. අපේ ජනකවි
3. ශ්‍රී ලංකාවේ සුන්දර දිය ඇලි
4. අසරණයන්ට පිහිට වෙමු (ලකුණු 14)

3. තලාඔය මහ විද්‍යාලයේ 8 ශ්‍රේණියේ සිසු සිසුවියන් සඳහා වාර්ෂික චාරිකාව යෙදී ඇත්තේ කොළඹ 07 පිහිටි ග්‍රහලෝකාගාරය නැරඹීමටයි. එය නැරඹීම සඳහා අවසර ඉල්ලා පාසලේ විදුහල්පති දයාරත්න රණසූරිය මහතා විසින් ග්‍රහලෝකාගාර අධ්‍යක්‍ෂකතුමා වෙත යැවෙන ලිපිය ලියන්න. (ලකුණු 10)

4. පහත සඳහන් පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

- සිය පිරිවර රට තොට හැම - වස්තුව නැති නිම්මා
එද ලොබ හැර ඔබ සමඟින් - තපසට ආ වෙම්මා
තරු පිරිවර පුන් සඳ මෙන් - වන මැද උන්නෙම්මා
වෙසතුරු පිය රජුනි ඔබට - බාරයි අපෙ අම්මා

- ආදා සිට හිමියේ අපි - සමඟිව ඉඳ නිතිනේ
රෑදා වල් වත් පිළිවෙත් - කළදැයි සම සිතිනේ
ආදා රෙත් ඔබ මිස නැත - අම්මාහට ඉතිනේ
බාධා නොව ඔබ බුදුවන් - අප දන් දුන් පිනිනේ

- ලපසේ සඳ විලසේ - දවසක් වෙන්නු වෙම්මා
එපසේ බුදු කෙනෙකුන් - මෙන් රැකදැයි නිතියෙම්මා
සැපසේ අප දන් දුන්නෙත් - වැදුවෙන්වද අම්මා
අපසේ පිය රජුනි දනට - නොදෙන්න අපෙ අම්මා

1. මෙහි සඳහන් වන රජතුමාගේ නම ලියන්න.
2. මෙහි එන උපමා දෙකක් උපුටා ලියන්න.

3. මෙම දරුවන් පියා වෙනුවෙන් කරන ප්‍රාර්ථනය කුමක් ද?
4. ඔවුන් පියාගෙන් කරන ඉල්ලීම දැක්වෙන කවි පදය ලියන්න.
5. ලොබ හැර, නැති නිම්මා යන පදවල තේරුම් ලියන්න. ( ලකුණු 02 X 05 - 10 )

05 පහත දී ඇති ප්‍රකාශ කවුරුන් විසින් කාහට කරන ලද්දේදැ'යි ලියන්න.

| ප්‍රකාශය | කවුරුන් විසින් | කාහට ද? |
|---|---|---|
| 1. '' සතුන් යොදා ගෙන කළ තවත් පර්යේෂණ තියෙනව ද? '' | | |
| 2. '' දළදා හාමුදුරුවන්ගේ පිහිටයි උඹට'' | | |
| 3. '' ඔව් අපි කැමතියි ඔහෙ කවුද කියලා දැනගන්ඩ'' | | |
| 4. '' සිරිපාදෙට පහන තිබ්බම ගල් හම්බ වෙයි'' | | |
| 5. '' දෙව් දහම් නම් හිර - සඳය'' | | |

( ලකුණු 01 X 01 - 10 )

06. පහත සඳහන් කවිවල හිස් තැන් පුරවන්න.

- අහසට පිඹිනා එරන් කලේයා.

  ............................................

  රන්මසු දහසක් වටින කලේයා

  ............................................

- එක් ගසකින් ලී හයක් කපාගෙන

  ............................................

  ඉතින් කෙළිමු ලී දෙපිල බෙදී ගෙන

  ............................................

( ලකුණු 2 1/2 X 04 - 10 )

07. පහත සඳහන් වාක්‍ය නිවැරදි කර නැවත ලියන්න.
1. පාලකයන් කම්කරුවන් ලවා වැඩ කරවයි.
2. දිසාපතිතුමා ජනතාව වෙනුවෙන් අවංක ව සේවය කරති.
3. ජල දහරාවන් කඳු මුදුනින් ඇද හැලෙති.
4. උදෑසන ම කුරුලු පන්ති නාද දෙයි.
5. අම්මා මල්ලී සමඟ කුඹුරට ගියහ. (ලකුණු 02 X 05 - 10)